සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| පළමු වාර පරීක්ෂණය 2017<br>முதலாம் தவணைப் பரீட்சை 2017<br>First Term Test 2017 | 07 ශ්‍රේණිය<br>தரம் 07<br>Grade 07 |
| ගණිතය<br>கணிதம்<br>Mathematics } I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two Hour |


**I - කොටස**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නම:


(01) සුළු කරන්න. $7 + 15 \div 3$

(02) දී ඇති කෝණය නම් කරන්න.




(03) සුළු කරන්න. $(+3) + (-5)$

(04) A කුලකය නිශ්චිතව ම හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මඟින් ලියා දක්වන්න.





(05) පහත දැක්වෙන සංඛ්‍යා අතුරෙන් 9 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

9829, 8172, 3501, 2229

(06) $a = 2$ නම්, $3a^2$ හි අගය සොයන්න.

(07) ක්‍රි.ව. 1815 අයත් වන සියවස කුමක්ද?

(08) දී ඇති රූපය ද්විපාර්ශ්වික සමමිතික වේද?
හේතු දක්වන්න.




(09) 2034 යන සංඛ්‍යාව ඉතිරි නැතිව 6 න් බෙදෙන සංඛ්‍යාවක් වේදැයි හේතු සහිතව දක්වන්න.

(10) 2005.02.05 දින උපන් අමාෂාගේ වයස 2017.03.15 දිනට සොයන්න.

(11) "20 ට අඩු ත්‍රිකෝණ සංඛ්‍යා" යන කුලකය, අවයව සියල්ල සඟල වරහන තුළ ලියා දක්වන්න.

(12) 8 සහ 20 යන සංඛ්‍යාවල ම.පො.ස. සොයන්න.

(13) සංඛ්‍යා රේඛාව මඟින් නිරූපිත ආකලනය ලියා අගය සොයන්න.



(14) දී ඇති සරල රේඛා ඛණ්ඩ තුළින් සමාන්තර සරල රේඛා ඛණ්ඩ යුගලයක් තෝරා ලියන්න.




(15) ටොෆි 25ක් ගැහැනු ළමයි 10 දෙනෙකු හා පිරිමි ළමයි 8 දෙනෙකු අතර එක බැගින් බෙදා දුන් විට ඉතිරි ටොෆි ගණන දැක්වීම සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(16) 24 හි ප්‍රථමක සාධක සියල්ල ලියන්න.

(17) පහත ප්‍රකාශන කුලකයක් වේ නම් "✓" ලකුණ ද කුලකයක් නොවේ නම් "×" ලකුණ ද යොදන්න.

| | | |
|---|---|---|
| 1. | 7 ශ්‍රේණියේ සිසුන් | |
| 2. | දක්ෂ ගායකයෝ | |
| 3. | ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක | |

(18) පහත දී ඇති හිස්තැන් " $<$ " , " $>$ " , " $=$ " ලකුණු යොදා සම්බන්ධ කරන්න.

(i) $2^3$ ............................ $3^2$ (ii) $2^4$ ..................$4^2$

(19) $10 = 2 \times 5$
$15 = 3 \times 5$ නම්
10, 15 හි කුඩා පොදු ගුණාකාරය සොයන්න.


(20) 152 වෙනි දශකය අයත්වන සියවස කුමක්ද?

**II - කොටස**


- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (a) සමපාද ත්‍රිකෝණයක ඇති සමමිති අක්ෂ ගණන කීයද? (ල. 2)


(b) දී ඇති රූපයේ ඇඳිය හැකි සමමිති අක්ෂ ගණන කීයද? (ල. 2)



(c) පහත දී ඇති රූපවල සමමිති අක්ෂ ඇඳ පෙන්වන්න. (ල. 2 x 2)



(d) කොටු දැල මත දක්වා ඇති එක් එක් රූපයෙහි ද්විපාර්ශ්වික සමමිතිය දක්වෙන සේ ඉතිරි අර්ධය සම්පූර්ණ කරන්න.



(ල. 2 x 2)

(02) (i) 16, 24 යන සංඛ්‍යා ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල. 4)

(ii) ඒ ඇසුරෙන් 16, 24 සංඛ්‍යාවල ම.පො.සා. සොයන්න. (ල. 3)

(iii) දිග 20cm හා පළල 15cm වන සෘජුකෝණාස්‍ර හැඩති රෙදි කැබලි පමණක් භාවිතා කර හිඩැස් නොපිහිටන සේ ඇලවීමෙන් සකස් කළ හැකි සමචතුරස්‍රාකාර බිත්ති සැරසිල්ලක පැත්තක අවම දිග සොයන්න. (ල. 3)

(iv) මිනුම් සඳහන් කරන ලද සැරසිල්ලේ දළ රූප සටහනක් ඇඳ පෙන්වන්න. (ල. 2)

(03) (a) සුළු කරන්න.

(i) (+3) + (+5) (ල. 2)

(ii) (+7) + (-7) (ල. 2)

(iii) (+3) + (-2) (ල. 2)

(b) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සුළු කරන්න.

(i) (-2) + (-3) (ල. 3)

(ii) (-1) + (+3) (ල. 3)

(04) (a) සුළු කරන්න.

(i) 3(8 + 5) - 8 (ල. 3)

(ii) 24 ÷ (17 - 5) + 1 (ල. 3)

(b) A = {50 ට අඩු සමචතුරස්‍ර සංඛ්‍යා} කුලකය

(i) අවයව සඟළ වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න. (ල. 3)


(ii) වෙන් රූප සටහනකින් ඉහත කුලකය නිරූපනය කර පෙන්වන්න. (ල. 3)

(05) (a) එක් එක් කෝණයට අනුව අදාළ කෝණ වර්ගය යා කරන්න.

| **කෝණයේ විශාලත්වය** | **කෝණ වර්ගය** |
|---|---|
| $187^0$ | මහා කෝණය |
| $28^0$ | සරල කෝණය |
| $126^0$ | සුළු කෝණය |
| $180^0$ | පරාවර්ත කෝණය |

(ල. 4)


(b) දී ඇති රූපයේ බාහු, ශීර්ෂය හා කෝණය නම් කරන්න.




(ල. 3)


(c) රූපයේ දැක්වෙන කෝණයට විශාලත්වයට ගැළපෙන සුදුසු අගය යටින් ඉරක් අඳින්න.

(i)



$(25^0 , 85^0 , 90^0)$

(ii)



$(360^0 , 120^0 , 180^0)$ (ල. 2)

(d) $300^0$ පරාවර්ත කෝණය අඳින්න. (ල. 3)

(06) (i) 54, පාද ප්‍රථමක සංඛ්‍යාවල බල වූ ගුණිතයක් ලෙස ලියන්න. (ල. 3)

(ii) a x a x a 7 x 7 යන ප්‍රකාශනය දර්ශක අංකනයෙන් ලියන්න. (ල. 2)

(iii) $x = 3$ ද $y = 1$ ද වන විට පහත ප්‍රකාශනයේ අගය සොයන්න.

(a) $x^2y$ (b) $xy^3$ (ල. 2 x 2)

(iv) $2^2 \times 5$ , $3^2 \times 2$ අගයන් වෙන වෙනම සොයා විශාල සංඛ්‍යාව සොයන්න. (ල. 3)

(07) (a) එකතු කරන්න.

(i)

| | අවු | මාස | දින |
|---|---|---|---|
| | 7 | 05 | 12 |
| + | 3 | 07 | 18 |
| | | | |

(ල. 3)

(ii) උපතේ සිට දින 15880 ක් ජීවත් වූ ඇතෙක් මිය යනවිට වයස අවුරුදු මාස දින වලින් සොයන්න.

(ල. 3)

(b) (i) AB සරල රේඛා ඛණ්ඩයක් අඳින්න. (ල. 1)

AB ට සමාන්තර CD රේඛා ඛණ්ඩය අඳින්න. (ල. 1)

එම රේඛා දෙකම කැපී යන සේ $xy$ රේඛා ඛණ්ඩය අඳින්න. (ල. 1)

$xy$ රේඛා ඛණ්ඩයට සමාන්තර වූ ද AB හා CD කැපී යනසේ PQ රේඛා ඛණ්ඩය අඳින්න.

(ල. 1)

(ii) ඔබට ලැබුණු බහුඅස්‍රය සඳහා නමක් යෝජනා කරන්න. (ල. 2)